දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112694033 , 0112675280
Telephone ) 0112675449

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපෑල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )


මගේ අංකය ) NA/01/Recruitment01//2025
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி ) 2025.09. 13
Date )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

## சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு

## Ministry of Health & Mass Media

**සිසුහෙද පුහුණුවට බඳවා ගැනීම - 2025**

**සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම.**

2025 වර්ෂයේ සිසු හෙද පුහුණු පාඨමාලාවට සිසුන් බඳවා ගැනීම සඳහා අංක 2,446 දරණ 2025.07.18 දිනැති ගැසට් නිවේදනයට අදාළව ඔබ විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත අනුව සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගේ නාම ලේඛනය ඇමුණුම 01 මගින් දක්වා ඇත. ඒ අනුව ඔබගේ සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණය 2025.09.20 දින සිට ආරම්භ වේ. එම සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන ස්ථාන, දිනයන් සහ කාලවේලාවන් ඇමුණුම 02 මගින් දක්වා ඇත.

02. ඒ අනුව ඇමුණුම 01 මගින් දක්වා ඇති නාම ලේඛනයේ ඔබට හිමි කැඳවීම් අංකය අනුව, ඇමුණුම 02 මගින් දක්වා ඇති කාලසටහන අනුව ඔබට නියමිත දිනයේදී නියමිත ස්ථානය වෙත පහත සඳහන් ලිපිලේඛනවල මුල් පිටපත් සමඟ සත්‍ය බවට තමන් විසින් සහතික කරන ලද ඡායා පිටපත් ද රැගෙන සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන මෙන් දන්වමි. ඒ සමග දකුණු පස ඉහල කෙලවරේ ඔබගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය, හා කැඳවීම් අංකය සටහන් කරන ලද ලිපිගොනු කවරයක් ද රැගෙන ආ යුතුවේ.

I. උප්පැන්න සහතිකය.

II. ජාතික හැඳුනුම්පත හෝ වලංගු ගමන් බලපත්‍රය හෝ වලංගු දේශීය රියදුරු බලපත්‍රය

III. ගැසට් නිවේදනයේ 7.3 ඡේදයේ සඳහන් පරිදි සහතික කරන ලද ඔබගේ අත්සනින් යුතු මුද්‍රිත අයදුම්පත. (Print out)

IV. අ.පො.ස. (උ.පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනය හා ‘ Z’ අගය දැක්වෙන සහතිකය. (විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද)
(විද්‍යා / ගණිත විෂය ධාරාව යටතේ, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, භෞතික විද්‍යාව හා ගණිතය) 2020 වර්ෂයේ (පැරණි නිර්දේශය / නව නිර්දේශය) හෝ 2021 වර්ෂයේ හෝ 2022 වර්ෂයේ විභාගවලින් එකකදී විෂයන් 03කින් එකවර සමත්වීම, (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර )

V. අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනය. (විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද විභාග ප්‍රතිඵල ලේඛන පමණක් සලකා බලනු ලැබේ. )

VI. රු. 1,000.00 ක මුදල ගෙවූ බවට සනාථ කෙරෙන රිසිට්පත.

VII. ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද සහතිකය. (DS 4 ආකෘතිය)

VIII. ශිෂ්‍ය කාර්ය දර්ශනය. (පාසල් හැරයාමේ සහතිකය) – (අධ්‍යාපන බී 59 පොදු ආකෘති පත්‍රය)

IX. විවාහය ලියාපදිංචි කරන ලද හෝ දික්කසාද වූ හෝ අයෙකු නොවන බව සනාථ කිරීම සඳහා සාමදාන විනිශ්චයකරුවකු ඉදිරියේ රු. 50.00 ක මුද්දරයක් මත අත්සන් කරන ලද දිවුරුම් ප්‍රකාශය. (ඇමුණුම 03)

X. බහුමාන සහතිකය. (වෙබ් අඩවියේ පළ කර ඇති බහුමාන සහතිකය සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු ය. (ඇමුණුම 04)

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවත්නා රජයේ විශ්වවිද්‍යාලයක/රජයේ විශ්වවිද්‍යාල විද්‍යායතනයක අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම් මත උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා "රජයේ නිදහස් අධ්‍යාපන වරප්‍රසාද" යටතේ අභ්‍යන්තර ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි වී සිටින හෝ හදාරමින් සිටින අයෙකු නොවන බවට,
- ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම්වලින් බඳවාගනු ලබන පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී සිටින හෝ හදාරමින් සිටින අයෙකු නොවන බවට,
- සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ හෝ වෙනත් රාජ්‍ය ආයතනයක හෝ අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම්වලින් බඳවාගනු ලබන පූර්ණකාලීන පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී සිටින හෝ හදාරමින් සිටින අයෙකු නොවන බවට,

XI. උක්ත ලේඛනවල සඳහන් නම්වල වෙනසක් ඇත්නම් සාමදාන විනිශ්චයකරුවකු ඉදිරියේ රු. 50.00 ක මුද්දරයක් මත අත්සන් කරන ලද දිවුරුම් ප්‍රකාශය.

03. ඉහත දක්වා ඇති සියලුම ලිපි ලේඛන සම්මුඛ පරීක්ෂණ දිනයේ දී ඉදිරිපත් කල යුතුය. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ මත හා අංක 2,446 දරණ 2025.07.18 දිනැති ගැසට් නිවේදනයේ විධිවිධානවලට යටත්ව සිසු හෙද පුහුණුව සඳහා සුදුස්සන් තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගීවන සියලුම අයදුම්කරුවන් පුහුණුවට බඳවා ගන්නා බවක් මෙහි ඇතුළත් කිසිදු වගන්තියකින් අදහස් නොකෙරෙන බව සැලකිය යුතුය. සම්මුඛ පරීක්ෂණ මගින් පුහුණුව සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන්ගේ නාම ලේඛනය www.health.gov.lk යන සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළකරනු ලබන අතර, ඒ සම්බන්ධයෙන් කිසිම අයදුම්කරුවෙකුට පෞද්ගලිකව දැනුම් දෙනු නොලැබේ.

04. සම්මුඛ පරීක්ෂණ පවත්වන අදාළ දිනයන්වල සියලුම අයදුම්කරුවන් අනිවාර්යයෙන් සහභාගී විය යුතු ය. සම්මුඛ පරීක්ෂණයට නියමිත දිනයන්හි දී පැමිණීමට අපොහොසත් වන අයදුම්කරුවන් නැවත සම්මුඛ පරීක්ෂණයන් සඳහා කැඳවීමට සලකා බලනු ලබන්නේ ඔහු / ඇය අසනීප තත්වයක් හේතුවෙන් පිළිගත හැකි වෛද්‍ය වාර්තා සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ දින සිට දින 07ක් ඇතුළත සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II වෙත ඉදිරිපත් කරන්නේනම් පමණි.

චාමික එච්. ගමගේ
අතිරේක ලේකම් (පාලන) II
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

චාමික එච්. ගමගේ
අතිරේක ලේකම් (පාලන) II

අත්/කළේ - විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය.